**ලාහුගල ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලාහුගල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ලාහුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාලව 2022 වර්ෂයේ ලැබී තිබූ රු.139,575 ක මුද්දර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂය තුළ දී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.225,905 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂය තුළ දී ලැබියයුතු මුද්දර ගාස්තු ආදායම ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම අතර මුදල් මාරු කිරීම් ලෙස පවතින රු.1,209,902 ක හඳුනා නොගත් හර ශේෂයක් විය. | හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරන බව. | හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ශේෂය, ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂයට සමාන විය යුතු වුවත් රු.139,939,907 ක නොසැසඳීමක් පැවතුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට උත්සාහ කරන බව. | නොසැසඳීම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (අ) | **මුදල් රෙගුලාසි 371** | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අත්තිකාරම් ලබා දී වර්ෂ 10 සිට වර්ෂ 24 දක්වා කාලයක් ගතව ඇති රු.86,066 ක අත්තිකාරම් මුදලින් රු.83,500 ක අත්තිකාරම් මුදල් ලබාගත් නිලධාරීන් පිළිබඳ තොරතුරු සභාව සතුව තිබිය දී එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | හඳුනාගෙන ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **මුදල් රෙගුලාසි 571** | තැන්පත් කර වසර 02 ක කාලය ඉක්මවා තිබූ රු.1,184,551 ක් වටිනා තැන්පතු ශේෂ අදාල පාර්ශවයන් වෙත නිදහස් කිරීමට හෝ මු.රෙ.571 ප්‍රකාරව ආදායමට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වසර 02 ඉක්ම වූ තැන්පත් මු.රෙ.571 ප්‍රකාරව ආදායමට ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.7.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සභාව විසින් රැස්කළ මුද්දර බදු වටිනාකම රු.117,153 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු නොකර පොදු තැන්පතු ගිණුමේ රඳවා තබාගෙන තිබුණි. | 2022 තුන්වන කාර්තුවේ සිට 2023 පළමු කාර්තුව දක්වා කාලය තුළ මුද්දර ගාස්තු 15,125 ක මුදලක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කළ බව. | ප්‍රමාදයකින් තොරව මුද්දර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.703,641 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.56,045 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් බැංකු ගිණුම් දෙකකට අදාළ බැංකු සැසඳුම් වාර්තාවවල දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවති රු.116,935 ක ශේෂ 05 ක් නිරවුල් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | මෙම අගයන් වර්ෂ ගණනාවක සිට පැවත එන අතර 2023 වර්ෂයේ එම අගයන් හඳුනාගෙන ඉවත් කිරීමට කටයුතු කරන බව. | මෙම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීට කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

**ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | - | - | - | - | - | - | - | - |
| ii. | කුලී | 1,891,000 | 490,512 | 350,663 | 139,849 | 2,391,000 | 537,511 | 336,903 | 200,608 |
| iii. | බලපත්‍ර ගාස්තු | 425,000 | 157,500 | 157,500 | - | 310,000 | 242,201 | 242,201 | - |
| iv. | වෙනත් ආදායම් | 700,000 | 246,264 | 246,264 | - | 2,425,000 | 2,260,933 | 1,886,103 | 374,830 |
| | එකතුව | 3,016,000 | 894,276 | 754,427 | 139,849 | 5,126,000 | 3,040,645 | 2,465,207 | 575,438 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වත්කම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණ** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි වටිනාකම ගිණුම්ගත කර තිබුණ ද එම ගොඩනැගිලි පිහිටි ඉඩම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී ගොඩනැගිලිවල වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන. | ඉඩම් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සභාව සතුව පවතින රථවාහන 13 ක් අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අප ආයතනය සතුව ඇති වාහන අලුත්වැඩියා කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට අපට ඉතා අපහසු අතර අපේ ආදායම් ඉහළ නැංවීම තුළින් පමණක් මෙම වාහන අලුත්වැඩියා කිරීමට හැකි බව. | රථ වාහන අලුත්වැඩියා කර නැවත භාවිතයට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව විසින් භාවිතා කරනු ලබන රථවාහන 10 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම වාහනවල අයිතිය පවරා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | වාහනවල අයිතිය සභාවේ නමට පවරාගත යුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ ලේකම් තනතුර ඇතුළුව තනතුරු 15 ක් පුරප්පාඩුව පැවතුණි. | ඉහළ නිලධාරීන් මේ සම්බන්ධව දැනුවත් කොට ඇති අතර කාර්යාල කටයුතු පවත්වාගෙන යනු ලබන්නේ දැඩි අපහසුතාවයෙන් බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |